**ශීර්ෂය 283 - වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 283 - වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 ජූලි 28 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 අගෝස්තු 18 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව | ක්‍රියාත්මක කර නොතිබූ නිර්දේශය | මෙම වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|
| 1.6.1 (අ) | 2021 දෙසැම්බර් 31 දිනට දේපළ පිරියත හා උපකරණ වටිනාකමෙහි මූල්‍ය තත්ත්ව ප්‍රකාශය අනුව හා භාණ්ඩාගාර මුද්‍රිත අනුව රු.369,361,875 ක වෙනසක් පැවතීම | 1.6.2 (ඇ) (iii) |

| | | |
|---|---|---|
| | හේතුවෙන් නිවැරදි දත්ත ඇතුළත් කර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු බව<br><br>. | |
| 1.6.1 (ඇ) | 2021 ජනවාරි 01 දිනට රු.415,455 ක් වූ නිල නිවාස වටිනාකමට එකතු කළ රු.3,370,000 ක වටිනාකම සනාථ කිරීමට අදාළ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීම හේතුවෙන් අනුව නිවැරදි දත්ත ඇතුළත් කර ගිණුම් පිළියෙල කර අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් කළ යුතු බව. | 1.6.2 (ඇ) (ii) |
| 1.6.1 (ඉ) | ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම වෙනුවෙන් 2021 වර්ෂය තුළ දරන ලද රු.1,237,217,599 කින් රු.1,188,135,714 ක් මූල්‍ය නොවන වත්කම් ගිණුම් වාර්තාවට ඇතුළත් කර නොතිබීම අනුව නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතු බව. | 1.6.2 (ඇ) (iv) |

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 ගිණුම් ඉදිරිපත් කිරීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 13 දිනැති අංක 2022/05 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන 2023 පෙබරවාරි 28 දිනට පෙර විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වුවද, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් 2022 වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබූ මූල්‍ය ප්‍රකාශනවල පැවති ප්‍රමාණාත්මක දෝෂ හේතුවෙන් 2023 අප්‍රේල් 25 දින එම මූල්‍ය ප්‍රකාශන ඉවත් කර ගන්නා ලදී. නැවත සකස් කරන ලද මූල්‍ය ප්‍රකාශන 2023 මැයි 31 දින විගණනය වෙත ඉදිරිපත් කර තිබුණු අතර ඒ අනුව ප්‍රමාද කාලය මාස 03 ක් විය. | අදහස් දක්වා නොමැත. | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශය ප්‍රකාරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන දෝෂ රහිතව සකස් කර නියමිත දිනට විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය. |

## 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

### (අ) ආදායම් ලැබීම්

දෙපාර්තමේන්තුවේ ආදායම් ලැබීම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | වාර්ෂික ඇස්තමේන්තු අනුව රජයේ කැළෑවලින් ලැබෙන ආදායමේ සංශෝධිත ඇස්තමේන්තුව රු.මිලියන 3,000 ක් වුවද, එය රු.මිලියන 1,600 ක් ලෙස ආදායම් ප්‍රකාශයේ දක්වා තිබුණි. වර්ෂය තුළ රැස්කළ තත්‍ය ආදායම රු.මිලියන 2,082 ක් වුයෙන් රු.මිලියන 918 කින් ආදායම සීමාව කරා ලඟා වීමට නොහැකි වී තිබුණි. | ඉදිරි වර්ෂයේදී නිවැරදිව ගිණුම් ඉදිරිපත් කරනු ලැබේ. | වාර්ෂික ඇස්තමේන්තුගත ආදායම් නිවැරදිව මුල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කර අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) | 2021 වර්ෂයේ රජයේ කැළෑවලින් ලැබෙන ආදායම් ගිණුමෙහි උපලේඛන 05 අනුව පසුගිය වසරට පෙර වර්ෂ සඳහා හිඟ ආදායම රු.555,018,063 ක් වුවද, 2022 වර්ෂයට අදාළ ආදායම් ගිණුමෙහි (DGSA –revenue 02) සහ ඊට අදාළ හිඟ ආදායම් ප්‍රකාශයෙහි එය රු.488,264,949 ක් ලෙස දක්වා තිබීමෙන් සමාලෝචිත වර්ෂයේ මුල්‍ය ප්‍රකාශනවල හිඟ ආදායම රු.66,753,114 ක් අඩුවෙන් දක්වා තිබුණි. | අදහස් දක්වා නොමැත. | හිඟ ආදායම් නිවැරදිව ගණනය කර ගිණුම් ගත කර අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (iii) | 2021 වර්ෂයේ රජයේ කැළෑවලින් ලැබෙන ආදායම් ගිණුමට අදාළ හිඟ ආදායම් වාර්තාව අනුව 2022 ජනවාරි 01 දිනට රු.1,060,445,374 ක් වූ පෙර වර්ෂයන්ට අදාළ හිඟ ආදායම 2022 දෙසැම්බර් 31 දිනට රු.59,920,642 ක් වීමෙන් 2022 වර්ෂය තුළ පෙර වර්ෂ වෙනුවෙන් රැස්කළ හිඟ ආදායම රු.1,000,524,732 ක් විය. එසේ වුවද, 2022 දෙසැම්බර් 31 දිනට ආදායම් ගිණුමේ (DGSA-revenue 02) එම හිඟ ආදායම රු.901,779,894 ක් වශයෙන් දක්වා තිබීමෙන් රු.98,744,838 ක වෙනසක් නිරූපණය විය. | ඉදිරි වර්ෂයේදී නිවැරදිව ගිණුම් ඉදිරිපත් කරනු ලැබේ. | එකතු කළ නිවැරදි ආදායම මුල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iv) | සමාලෝචිත වර්ෂයේ හිඟ ආදායම් වාර්තාව අනුව, අම්පාර දිසා වන කාර්යාලයට අදාළව 2019 වර්ෂයේදී හඳුනාගත යුතු රු.32,733,901 ක හිඟ ආදායමක් 2022 වර්ෂයේදී හඳුනාගෙන ගිණුම්ගත කර තිබුණු අතර එයින් රු.31,982,888 ක් 2022 වර්ෂය අවසාන වන විටත් අයකරගෙන නොතිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුවේ හිඟ ආදායම් ගණනය කිරීමේ පද්ධතිය සතුටුදායක නොවන බවට නිරීක්ෂණය විය. | ඉදිරි වර්ෂයේදී ආදායම් ගිණුම් පිළියෙළ කිරීමේදී නිවැරදිව ගිණුම් ඉදිරිපත් කරනු ලැබේ. | හිඟ ආදායම් නිවැරදිව හඳුනා ගැනීම සහ රැස් කිරීම සම්බන්ධයෙන් නිසි අභ්‍යන්තර පාලන පද්ධතියක් ස්ථාපිත කළ යුතුය. |
| (v) | පොළොන්නරුව සහ මුලතිව් දිසා වන කාර්යාල විසින් 2017 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාලය තුළ ගල්කොරි හිමියන් දෙදෙනෙකුගෙන් හා පුද්ගලික සමාගමකින් අය කරගත යුතු පිළිවෙලින් රු.77,366,295ක හා රු.121,613,898 ක හිඟ ගාස්තු අය කරගෙන නොතිබුණු අතර ඒවා හිඟ මුදල් පිළිබඳ ප්‍රකාශනයට ද ඇතුළත් කර නොතිබුණි. | හිඟ ගාස්තු වලින් සියයට 25 ක් පමණක් වාරික 36 කින් අයකර ගන්නා ලෙස නිලධාරීන් දැනුවත් කර ඇති අතර පුද්ගලික සමාගමෙන් හිඟ පුරස්කාර මුදල අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත. | හිඟ ආදායම් නිවැරදිව ගිණුම් ගත කර අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**(ආ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය**

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.10,715,114 ක ණය ශේෂයෙන් මාස 03 ක සිට වසර 05 ක් දක්වා කාලයක් ගත වී ඇති රු.8,912,194 ක ණය ශේෂයක් ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.1 ඡේදය ප්‍රකාරව නිරවුල් කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි. | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මඟින් නිරවුල් කළ යුතු වටිනාකම රු.5,286,508 ක් ද, පොත් වලින් කපා හැරීමට අපේක්ෂිත වටිනාකම රු.4,633,250 ක් ද වේ. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව ණය මුදල් අයකර ගැනීමට කළමණාකාරිත්වය විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

**(ඇ) තැන්පතු**

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී පරිසරයට සිදුවන බලපෑම පුනස්ථාපනය කිරීම සඳහා 2007 වර්ෂයේ ලැබී වැය නොකළ | පිළිතුරු ලබා දී නොමැත. | තව දුරටත් තැන්පත් ලෙස පවත්වාගෙන යාමේ අවශ්‍යතාවයක් නොමැති |

| | | |
|---|---|---|
| රු.1,106,846 ක් වසර 16 ක් තිස්සේ ද, පරිසර සමීක්ෂණ අධ්‍යයන වැඩසටහන් 15 ක පරිපාලන වියදම් වෙනුවෙන් ලබා දී තිබුණු රු.1,152,314 ක් වර්ෂ 10 කට අධික කාලයක් තිස්සේ ද, රු.380,273,079 ක් වසර 02 කට වැඩි කාලයක් තිස්සේ ද මුදල් රෙගුලාසි 571(2) ප්‍රකාරව රජයේ ආදායමට බැරකිරීමට කටයුතු නොකර තැන්පත් ගිණුම් 04 ක රඳවා තිබුණි. | | තැන්පත් හඳුනාගෙන රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කළ යුතුය. |

**(ඇ) දේපල පිරියත හා උපකරණ**

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | 2021 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන අනුව වැය විෂයයන් 14 ක් යටතේ මිලදීගෙන තිබූ එකතුව රු. 604,218,923 ක් වූ ස්ථාවර වත්කම් ශේෂයන් 2022 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂයන් ලෙස ගැනීමේ දී වැය විෂයයන් 09 ක වටිනාකම රු.1,988,535,398 ක් වැඩියෙන් ද, වැය විෂයයන් 05 ක වටිනාකම රු.700,225 ක් අඩුවෙන් ද වශයෙන් ගිණුම්වල දැක්වීම හේතුවෙන් 2022 ජනවාරි 01 දිනට වත්කම් ශේෂය රු.1,987,835,173 කින් වැඩියෙන් දක්වා තිබුණි. | මූල්‍ය නොවන වත්කම් ආරම්භක ශේෂය නොගැලපීම ජර්නල් මඟින් ගැලපීමට උපදෙස් හා මග පෙන්වීම ලබා දෙන ලදි. | ආරම්භක ශේෂ වෙනස්වීමට බලපෑ හේතු හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ii) | 2022 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව දේපළ, පිරියත හා උපකරණවල රු.4,229,027,677 ක් වූ වටිනාකම රු.4,210,202,677 ක් වශයෙන් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි දක්වා තිබීමෙන් රු.18,825,000 ක වෙනසක් නිරීක්ෂණය විය. | පිළිතුර නිවැරදි නොවේ. | සිදු වී ඇති වෙනස නිවැරදිව හඳුනාගෙන ගිණුම්වලින් ගැලපීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iii) | 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් නිල නිවාසවල ආරම්භක ශේෂය වූ රු.415,455 ට එකතු කරන ලද රු.3,370,000 ක අගය තහවුරු කිරීමට අදාළ තොරතුරු 2023 ජුනි 30 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් තොරතුරු සනාථ කළ යුතුය. |
| (iv) | ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම වෙනුවෙන් 2021 වර්ෂය තුළ දරන ලද එහෙත් මූල්‍ය නොවන වත්කම් ලෙස ගිණුම් වාර්තාවට ඇතුළත් කර නොතිබුණු රු.1,188,135,714 ක් 2022 වර්ෂයේ ගිණුම්වලට ද ඇතුළත් කර නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | නිවැරදි දත්ත ඇතුළත් කර ගිණුම් නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (v) | දෙපාර්තමේන්තුව සතු මෝටර් සයිකල් 400 කට අධික ප්‍රමාණයක් තිබෙන නමුත් ඒවා තක්සේරු කිරීමට කටයුතු නොකර වටිනාකම 37,500 ක් වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ආයතනය සතු වත්කම් නිවැරදිව ගණනය කිරීමටත්, නිවැරදිව ලේඛන ගත කිරීමටත් ඉදිරියේදී කටයුතු කරන බව දන්වා සිටිමි. | වාහනවල තක්සේරු වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතුය. |

**(ඉ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | **ස්ථාවර වත්කම් ලේඛනය**<br>මූල්‍ය නොවන වත්කම්හි ගිණුම්මය නිවැරදිතාවය පවත්වා ගැනීම සඳහා දෙපාර්තමේන්තුව විසින් විධිමත් ලෙස පොත්පත් පවත්වාගෙන යායුතු වුවත් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | ඉදිරියේදී අවශ්‍ය නිවැරදි කිරීම් කිරීමට කටයුතු කරනු ලැබේ. | 2022 දෙසැම්බර් 13 දිනැති අංක 2022/05 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 8.1 ඡේදය ප්‍රකාරව සිගැස් වැඩසටහන මගින් හඳුන්වා දී ඇති මොඩියුලය ආශ්‍රයෙන් ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර වත්කම් කළමනාකරණය විධිමත්ව පවත්වා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | **මුදල් පොත**<br>2022 දෙසැම්බර් 13 දිනැති අංක 2022/05 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 8.4 ඡේදය ප්‍රකාරව අතින් පවත්වාගෙන යනු ලබන මුදල් පොත යාවත්කාලින කිරීමට හෝ සිගැස් වැඩසටහන හරහා ලබාගත් මුදල් පොතේ මුද්‍රිත පිටපතක් වෙනම ගොනු කිරීමට හෝ කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත | මාර්ගෝපදේශයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව අතින් පවත්වාගෙන යනු ලබන මුදල් පොත යාවත්කාලින කිරීමට හෝ සිගැස් වැඩසටහන හරහා ලබාගත් මුදල් පොතේ මුද්‍රිත පිටපතක් වෙනම ගොනු කිරීමට හෝ කටයුතු කළ යුතුය. |
| (iii) | **දෙපාර්තමේන්තු විසර්ජන (සම්මත වැය) ලෙජරය**<br>මුදල් රෙගුලාසි 447 ප්‍රකාර දෙපාර්තමේන්තු විසර්ජන (සම්මත වැය) ලෙජරය යාවත්කාලින කර නොතිබුණි. | අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කරමින් පවතී. | මුදල් රෙගුලාසි හි සඳහන් විධිවිධාන පරිදි 138 වැනි පොදු පෝර්මය අනුව දෙපාර්තමේන්තු විසර්ජන (සම්මත වැය) ලෙජරයට වවුචර අංකය, වියදම්වල මුළු එකතුව, ඉතිරි ප්‍රතිපාදනය ආදී කරුණු ඇතුළත් කර යාවත්කාලීන කර පවත්වා ගත යුතුය. |
| (iv) | **බඩු ලේඛන පොත**<br>මු.රෙ.454 ප්‍රකාරව ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන ගොස් නොතිබුණි. | අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කරමින් පවතී. | මුදල් රෙගුලාසියේ විධිවිධාන ප්‍රකාරව 44 වැනි පොදු ආකෘතිය පරිදි බඩු ලේඛන පොත යාවත්කාලින කර පවත්වා ගත යුතු වීම. |
| (v) | **ඇප ලේඛනය**<br>මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් හඳුනාගෙන ඇප අය කර ගැනීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණු අතර මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරින් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කරමින් පවතී. | මුදල් රෙගුලාසි 890 හා 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් හඳුනාගෙන ඇප අය කර එම තොරතුරු ඇතුළත් වන පරිදි ඇප ලේඛනයක් පවත්වා ගත යුතු වීම. |
| (vi) | **හානි පිළිබඳ ලේඛනය**<br>මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි හා පාඩු පිළිබඳ ලේඛනයක් පවත්වාගෙන ගිය ද එම ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන ගොස් නොතිබුණි. | අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කරමින් පවතී. | මුදල් රෙගුලාසිය ප්‍රකාර වන ආකෘතිය අනුව හානි පිළිබඳ ලේඛනයක් විධිමත් ලෙස පවත්වා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (vii) | **බැරකම් පිළිබඳ ලේඛනය**<br>මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් පිළිබඳ ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. | අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කරමින් පවතී. | නිතිපතා බැරකම් පරික්ෂා කළ හැකි වන පරදි බැරකම් ලේඛනයක් පවත්වාගෙන යා යුතුය. |
| (viii) | **ණය සහ අත්තිකාරම් ලේඛනය**<br>2017 ජූලි 05 දිනැති අංක 256/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 05 ඡේදය ප්‍රකාරව සී.සී.10 ආකෘතිය හා ඒ ආකෘතිය පදනම් කරගෙන ණය හා අත්තිකාරම් ලේඛන පිළියෙල කළ යුතු වුවත් ණය හා අත්තිකාරම් ලේඛනය, ණය ගැති ලේඛනය, ණය හිමි ලේඛනය හා අත්තිකාරම් පාලන ගිණුම යාවත්කාලින කර නිසි පරිදි පවත්වාගෙන ගොස් නොතිබුණි. | විගණනය විසින් පෙන්වා ඇති අඩුපාඩු නැවත ඇති නොවන පරිදි 2023 වර්ෂයේ අත්තිකාරම් "බී" සැසඳුම් ප්‍රකාශය පිලියෙල කිරීමේදී කටයුතු කරන ලෙස විෂය නිලධාරින්ට හා අධීක්ෂණ නිලධාරින්ට උපදෙස් හා මඟපෙන්වීම් ලබා දෙන ලදී. | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් සම්බන්ධයෙන් ප්‍රමාණවත් ගිණුම් ක්‍රමයක් හා අභ්‍යන්තර පාලන ක්‍රමයක් පවත්වා ගැනීම සඳහා මෙම ලේඛන යාවත්කාලීන කර පවත්වා ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීම, හිඟහිටි ආදායම් රැස්කිරීම, අදායම් අත්හැරීම් හා කපා හැරීම් සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| | <u>විගණන නිරීක්ෂණය</u> | <u>ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම</u> | <u>නිර්දේශය</u> |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තු කළමනාකරණය යටතේ පවතින ඉඩම්වල පිහිටි කළුගල් කඩා ඉවත් කිරීමේ දී 2009 මැයි 06 දිනැති අංක 1600/18 දරන ගැසට් නිවේදනය ප්‍රකාරව 2020 වර්ෂය දක්වා අයකළ ගාස්තු, සාධාරණ හේතුවක් නොමැතිව සියයට 50 කින් අඩු කිරීමට 2020 නොවැම්බර් 13 දිනැති අංක 14/2020 දරන ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණි. ඒ අනුව ගාස්තු අඩු කිරීම හේතුවෙන් රාජ්‍ය ආදායම විශාල ලෙස පහළ බැස තිබෙන බව 2021 වර්ෂයේ විගණනයෙන් පෙන්වා දී තිබුණ ද, ඒ කෙරෙහි අවධානය යොමු කර නොතිබුණු අතර 2022 වර්ෂයට අදාළව තොරතුරු ඉදිරිපත් කළ | පිළිතුරු ලබා දී නොමැත. | රජය විසින් වන සම්පත ආරක්ෂා කිරීම සහ වන කළමනාකරණය කිරීම වෙනුවෙන් විශාල පිරිවැයක් දරන බැවින් අයකළ ගාස්තු අඩු නොකර වනජ ද්‍රව්‍ය නිකුත් කිරීම හේතුවෙන් සිදුවන පාරිසරික හානිය ප්‍රතිස්ථාපනය කිරීමට ප්‍රමාණවත් ගාස්තුවක් අදාළ පාර්ශවයන්ගෙන් අයකර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | දිසාවන කාර්යාල 05 ක පමණක් කලු ගල් කැඩීමෙන් අහිමි වූ ආදායම රු.18,204,346 ක් විය. | | |
| (ආ) | දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ආදායම් ප්‍රභවයන් වූ කැළෑවලින් ලැබෙන ආදායම සහ පෞද්ගලික දැව ප්‍රවාහනයෙන් ලැබෙන ආදායම, නිවැරදිව ඇස්තමේන්තු කිරීම, හිඟ ආදායම් ගණනය කිරීම සහ අයකර ගැනීම සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන ක්‍රම ස්ථාපිත කර නොතිබීමෙන් අදාළ පාර්ශවයන් රාජ්‍ය ආදායමට මුදල් බැර කිරීම පැහැර හරින බවට නිරීක්ෂණය වූ අතර 2021 දෙසැම්බර් 31 දිනට රු.1,491,611,273 ක් වූ හිඟ ආදායම, 2022 දෙසැම්බර් 31 දිනට රු.1,885,180,372 ක් දක්වා ඉහළ ගොස් තිබුණි. | පුරස්කාර ක්‍රමවේදය මත ලැබෙන මෙම ආදායම නිෂ්පාදිත ඒකක මත ගණනය කිරීමෙන් පසුව අයකර ගන්නා බැවින් නිරන්තරයෙන් හිඟ ආදායම් ඇති වේ. ඊළඟ වර්ෂයේ ගිවිසුම්ගත වීමේදී සියළුම හිඟ ආදායම් අය කර ගැනීමෙන් පසු ගිවිසුම් ගතවේ. | පවතින නීති රීති අනුව හිඟ ආදායම් කාලීනව අයකර ගැනීමටත්, ආදායම් නිවැරදිව ඇස්තමේන්තු කිරීමට සහ ආදායම් කළමනාකරණය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන ක්‍රම ස්ථාපිත කිරීමටත් කළමනාකාරිත්වය කටයුතු කළ යුතුය. |
| (ඇ) | පුද්ගලික දුරකථන ආයතනයක් විසින් 2020 සහ 2021 වර්ෂවල දී දුරකථන සම්ප්‍රේෂණ කුළුණු 08ක් ඉදිකිරීමට අනුමැතිය ඉල්ලා තිබුණ ද අදාළ නිලධාරීන් සිය රාජකාරී අතපසු කිරීම හේතුවෙන් ලබා ගත හැකිව තිබූ බලපත්‍ර ආදායම රජයට අහිමි වී තිබුණි. | වසර කිහිපයක සිට ඇති වී ඇති ආර්ථික දේශපාලනමය තත්වය මත ගමට සන්නිවේදන ව්‍යාපෘති යටතේ ඉදිකිරීමට තිබුණ මෙම කුළුණු ඉදිකිරීම තාවකාලිකව අත්හිටුවා ඇත. වේරගල කන්ද වදාකඩ කුළුණ සඳහා බලපත්‍රය ලබා දී ඇත. | රාජ්‍ය ආදායම ඉහළ නංවා ගැනීම සඳහා පවතින අවස්ථා මග නොහැර උපයෝගී කර ගැනීමට කාර්යක්ෂමව ක්‍රියා කළ යතුය. |
| (ඇ) | 2015 ජුලි 20 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය මුල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 04 වන ඡේදය ප්‍රකාරව ආදායම් පරිපාලනය හා ගිණුම්කරණය වැඩි දියුණු කිරීම, අධීක්ෂණ කටයුතු සහ ප්‍රතිපත්ති විශ්ලේෂණය යනාදිය සඳහා අයවීමට ඇති ආදායම් ප්‍රමාණය හා එකතු කරන ලද ආදායම් ප්‍රමාණය පැහැදිලිව, ක්‍රමවත්ව හා නිවැරදිව හඳුනා ගතහැකි ආකාරයට වාර්තා පවත්වාගෙන නොතිබුණි. | ඉදිරියේදී ආකෘති රාමුවක් පිළියෙල කර, එකතු කිරීමට අපේක්ෂිත ආදායම් නිශ්චය කොට ඉලක්ක කරා ලඟා වීම හා පසු විපරම් කිරීම් කටයුතු වගකීම් පවරා ආදායම් එක් රැස් කිරීම් නියාමනය කිරීමට කටයුතු කරන බව වාර්තා කරමි. | චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව ආදායම් කළමනාකරණය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන ක්‍රම ස්ථාපිත කිරීමට කළමනාකාරිත්වය කටයුතු කළ යුතුය. |

## 2.2 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නැත. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | වාර්ෂික සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු අතර, ඊට අමතරව විගණනය කරනු ලබන ආයතනයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වගබලාගත යුතු වුවත්, වාර්තාවේ 1.6.1 සහ 3.4 ඡේදවල සඳහන් විගණන නිරීක්ෂණ හේතුවෙන් එම අවශ්‍යතා ඉටු කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නැත. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 3.9 ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබා දි නොතිබුණි. | පිළිතුරු ලබා දී නැත. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීති, රීති හා රෙගුලාසි වලට යොමුව | නිරීක්ෂණය වටිනාකම රු. | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | | |
| | (i) මුදල් රෙගුලාසි 104(4) | - | අලාභ හානිය සිදුවූ දිනය සිට තුන් මසක් ඇතුළත පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුවත්, 2020 සහ 2021 වර්ෂවල සිදු වූ හානි සම්බන්ධයෙන් එලෙස කටයුතු කර නොතිබිමෙන් අලාභ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි. | පෙන්වා දී ඇති පරිදි නියමිත කාලසීමාව ඇතුළත සිදු වූ අලාභ අයකර ගැනීමටත් අඩුපාඩු නිවැරදි කිරීමටත් කටයුතු කරමින් පවතී. | මුදල් රෙගුලාසිය ප්‍රකාරව අලාභ හානිය සිදුවූ දින සිට තුන් මසක් ඇතුළත පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |
| | (ii) මුදල් රෙගුලාසි 371(2) හා (5) | 637,480 | අත්තිකාරම් ලබා ගත් කාර්යය අවසන් වූ විගස අග්‍රිමය පියවිය යුතු වුවද, අවස්ථා 41 කදී ලබාගත් අත්තිකාරම් පියවීමට දින 15 සිට දින 256 දක්වා කාලයක් ගතකර තිබුණි. | අඩුපාඩු නැවත ඇති නොවන පරිදි කටයුතු කිරීමට උපදෙස් හා මග පෙන්වීම් ලබා දී ඇත. | අත්තිකාරම් ලබා ගත් කාර්යය අවසන් කළ වහාම පියවා ගැනීමටත්, අභ්‍යන්තර පාලන විධිවිධාන ශක්තිමත් කිරීමටත් පියවර ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (iii) මුදල් රෙගුලාසි 395 (ඇ) | - | 2022 දෙසැම්බර් 31 දිනට බැංකු ගිණුම් 29 කට අදාළ සැසඳුම් ප්‍රකාශ විගණනයට ඉදිරිපත් නොවීය. | අඩුපාඩු නිවැරදි කිරීමට උපදෙස් ලබා දෙන ලදි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව බැංකු සැසඳුම් ප්‍රකාශ සකස් කර නියමිත දිනට ඉදිරිපත් කළ යුතුය. |
| (iv)මුදල් රෙගුලාසි 396 (ඇ) | 544,505 | 2022 දෙසැම්බර් 31 දින වන විට නිකුත් කර මාස 06 ක් ඉක්මවූ චෙක්පත් 190 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | පිළිතුර නිවැරදි නොවේ. | නිකුත් කළ දින සිට මාස 06 ක් ඉක්මවූ චෙක්පත් මුදල් රෙගුලාසි ප්‍රකාරව ආදායමට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (v)මුදල් රෙගුලාසි 565(3) | - | පොදු තැන්පත් ගිණුම් සම්බන්ධයෙන් තුලන ගිණුම් පිළියෙල කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | පොදු තැන්පත් ගිණුම සම්බන්ධයෙන් සෑම මසකම තුලන ගිණුමක් පිළියෙල කර එය භාණ්ඩාගාර මුද්‍රිත සටහන් සමඟ සැසඳිය යුතුය. |
| (vi)මුදල් රෙගුලාසි 565(5) | - | පොදු තැන්පත් ගිණුමට අදාළව පොදු 71 ආකෘති පත්‍රයෙහි පිළියෙල කර ඊළඟ මාසය අවසන් වීමට පෙර විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු මාසික තැන්පතු සාරාංශ ප්‍රකාශ පිළියෙල කර නොතිබුණි. | පිළිතරු ලබා දී නොමැත. | රෙගුලාසි ප්‍රකාරව මාසික තැන්පතු සාරාංශ ප්‍රකාශය සකස් කර ඉදිරිපත් කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ආ) | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 හා මුදල් රෙගුලාසි 507 හා 756 | - | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයන් කර අදාළ වාර්තා ඊළඟ වර්ෂයේ ජූනි 15 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු නමුත් දෙපාර්තමේන්තුව විසින් 2021 වර්ෂය සඳහා වූ භාණ්ඩ සමීක්ෂණ වාර්තා ඉදිරිපත් කර අවසන් කිරීමටත්, 2022 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කිරීමටත් කටයුතු කර නොතිබුණි. | පිළිතරු ලබා දී නොමැත. | චක්‍රලේඛයේ විධි විධාන ප්‍රකාරව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයන් නියමිත කාල වකවානු තුළ අවසන් කර විගණකාධිපති වෙත වාර්තා ඉදිරිපත් කර වත්කම් කළමනාකරණය සඳහා යහපත් පාලන පද්ධතියක් ස්ථාපිත කළ යුතුය. |
| (ඇ) | 2016 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 30/2016 | - | මාස 12 ක ධාවන කාලයකට පසුව හෝ කිලෝමීටර් 25,000 ක් ධාවනය කිරීමෙන් අනතුරුව හෝ එන්ජිම සම්බන්ධ ප්‍රධාන අලුත්වැඩියාවකින් පසුව හෝ සිදු කළ යුතු ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂාව වර්ෂ ගණනාවක සිට සිදුකර නොතිබුණි. | ඉන්ධන දහනය පරීක්ෂාව ආරම්භ කිරීමත් සමග චක්‍රලේඛයේ ඇමුණුම් 01 පරිදි ලේඛනයක් පවත්වාගෙන යාමට කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛ විධි විධාන ප්‍රකාරව වත්කම් කළමනාකරණය පිළිබඳ යහපත් අභ්‍යන්තර පාලන පද්ධතියක් පවත්වා ගත යුතුය. |

## 2.4 අවිධිමත් ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පරිසර පද්ධති සංරක්ෂණ සහ කළමනාකරණ ව්‍යාපෘතියේ (ESCAMP) ප්‍රතිපාදන යටතේ කන්නෙලිය රක්ෂිතයේ ක්‍රියාත්මක කරන ලද ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව ගිවිසුම් කාලය ද ඉක්මවා අතරමඟ නතර කර තිබුණු අතර ඒ සඳහා ගෙවන ලද රු.4,750,000 ක වැඩ මූලික අත්තිකාරම් මුදලින් රු.3,723,637 ක් ඉටුකළ වැඩ සඳහා කොටස් මුදල් ගෙවීමේ දී අයකර ගැනීමටත්, ඊට අදාළ ඇපකරයේ කාලය ද දීර්ඝ කර ගැනීමටත් කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | කොන්ත්‍රාත්කරුට ගෙවන ලද වැඩමූලික අත්තිකාරම් මුදල් ඉදිරිපත් කළ බිල්පත්වලින් අයකර ගැනීමට කටයුතු නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගැනීමටත්, අයවිය යුතු මුදල් සුදුසු පරිදි අයකර ගැනීමටත් කටයුතු කළ යුතුය. |

## 2.5 බැංකු ගිණුම් මෙහෙයවීම

බැංකු ගිණුම් මෙහෙයවීම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය වු අඩුපාඩු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශූන්‍ය ශේෂයක් පවතින බැංකු ගිණුම් 18 ක් සක්‍රියව පවතී ද යන්න විගණනයට සනාථ නොකළ අතර මාස 06 කට වඩා කාලයක් අක්‍රීයව පවතින බැංකු ගිණුම් පිළිබඳව සොයා බලා ඒවා අවලංගු කිරීම කෙරෙහි ද අවධානය යොමු කර නොතිබුණි. | මේ වන විට අවසන් වී ඇති ESCAMP ව්‍යාපෘතියට අදාළ ශූන්‍ය වටිනාකමක් සහිත එම බැංකු ගිණුම් වසා දැමීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | ශූන්‍ය ශේෂයක් පවතින මාස 06 කට වඩා වැඩි කාලයක් අක්‍රීයව පවතින බැංකු ගිණුම් භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛ අංක 03/2015 හි සඳහන් විධිවිධාන ප්‍රකාරව වසා දැමිය යුතුය. |
| (ආ) | 2022 දෙසැම්බර් 31 දිනට දිසා වන කාර්යාල හා ප්‍රධාන කාර්යාලයේ බැංකු සැසඳුම් ප්‍රකාශ 19 ක අවස්ථා 188 කදී හඳුනා නොගත් ලැබීම් රු.19,338,009 ක් පැවති අතර ඒවා නිවැරදිව හඳුනා ගෙන මුදල් පොතට ගැලපීමට කටයුතු කර නොතිබීමෙන් මහ භාණ්ඩාගාරයට නිවැරදිව ගිණුම් පියවා ඇති බවට සනාථ කළ නොහැකි විය. | නිවැරදි කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබේ. | බැංකුවට කර ඇති සෘජු බැර කිරීම් හඳුනාගෙන ඒ ඒ අවස්ථාවේ දී මුදල් පොතට ගෙන මහා භාණ්ඩාගාරයට නිවැරදිව ගිණුම් පියවීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 දැක්ම හා මෙහෙවර

දැක්ම හා මෙහෙවර සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 දෙසැම්බර් අවසන් වන විට දෙපාර්තමේන්තු පරිපාලනය යටතේ පවතින රක්ෂිත, සංරක්ෂිත සහ වෙනත් කැළෑ ඉඩම් මුළු ඉඩම් ප්‍රමාණය සහ ගැසට් කරන ලද මුළු ඉඩම් ප්‍රමාණය පිළිබඳව ප්‍රමාණවත් තොරතුරු විගණනයේ දී ලබා ගැනීමට නොහැකි වූ අතර කැළෑ ඉඩම් ගැසට් කිරීම මන්දගාමීව පවතින බව ප්‍රාදේශීය කාර්යාල | පිළිතුරු ලබා දී නොමැත. | දෙපාර්තමේන්තු පරිපාලනය යටතේ පවතින සමස්ථ කැළෑ භූමි ප්‍රමාණය සහ ගැසට් කරන ලද මුළු ඉඩම් ප්‍රමාණය පිළිබඳව නිවැරදි දත්ත පවත්වා ගැනීමටත්, කැළෑ ඉඩම් ගැසට් කිරීම කාර්යක්ෂමව කිරීමටත් කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සම්බන්ධයෙන් සිදුකරන ලද ක්ෂේත්‍ර පරීක්ෂාවන්වල දී නිරීක්ෂණය විය. | | |
| (ආ) | 2020 නොවැම්බර් 04 දිනැති අංක 1/2020 දරන වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශ ලේකම්වරයාගේ චක්‍රලේඛය ප්‍රකාරව රාජ්‍ය ආයතනයකට අයත් නොවන අවශේෂ කැළෑ ඉඩම් වෙනත් කාර්යයන් සඳහා භාවිතා කිරීමට දිස්ත්‍රික් ලේකම්වරුන්ට හා ප්‍රාදේශීය ලේකම්වරුන්ට ඉඩකඩ සලසා දීම හේතුවෙන් රක්ෂිත වශයෙන් දෙපාර්තමේන්තු පාලනය යටතේ තබා ගත යුතු ඇතැම් වන සම්පත් තව දුරටත් ආරක්ෂා කර ගැනීමේ හා තිරසාර සංවර්ධන ඉලක්ක ළඟාකර ගැනීමේ තර්ජනයකට ලක්විය හැකි බවට නිරීක්ෂණය කෙරේ. | පිළිතුරු ලබා දී නොමැත. | දෙපාර්තමේන්තු පාලනය යටතේ තව දුරටත් පවත්වා ගත යුතු ඉඩම් ද, මෙලෙස බැහැර කිරීමේ අවධානමක් පවතින බැවින් ඉඩම්වල විධිමත් අයිතිය තහවුරු කර ගත යුතුය. |
| (ඇ) | මුලතිව් දිසා වන කාර්යාල යටතේ පාලනය වන හෙක්ටයාර් 178,218.7 ක භූමි ප්‍රමාණයෙන් හෙක්ටයාර් 1,550 ක් මැණුම් කර නොතිබුණු අතර 1932 වර්ෂයේ හෙක්ටයාර් 6,825 ක් හා ඊට වසර 80 කට පසු 2012 හා 2019 වර්ෂ අතර කාලය තුළ හෙක්ටයාර් 74,797.63 ක් ගැසට් කිරීමෙන් පසු මැණුම් කර තිබූ හෙක්ටයාර් 10,892.44 ක් ගැසට් කිරීමට කටයුතු කර නොතිබුණි. එසේම කුරුණෑගල දිසා වන කාර්යාලය යටතේ පාලනය වන හෙක්ටයාර් 52,395.21 ක භූමි ප්‍රමාණයෙන් මැණීම් කරන ලද හෙක්ටයාර් 13,377.06 ක් ගැසට් කිරීමට කටයුතු කර නොතිබුණු අතර 1895, 1918, 1936 හා 1939 යන වර්ෂයන්හි ගැසට් කරන ලද කුරුණෑගල මොරගොල්ල, දේවගිරි කන්ද, තල්ගමුව හා මාරගල් කන්ද යන වනාන්තරවල හෙක්ටයාර් 352.6 ක් මැනීම් කර මායිම් තහවුරු කර ගැනීමට ද කටයුතු කර නොතිබුණි. ඒ අනුව මැණුම් කිරීමේ හා ඉඩම් ගැසට් කිරීමේ කටයුතු මන්දගාමීව සිදු වන බවටත්, වන අපරාධ සම්බන්ධයෙන් නීතිමය | 2022.03.04 දින අමාත්‍යාංශ ලේකම්ගේ ප්‍රධානත්වයෙන් වවුනියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී පැවති රැස්වීමේදී දේශපාලන අධිකාරිය හා දිස්ත්‍රික් ලේකම්ගේ ඉල්ලීම මත මුලතිව් දිස්ත්‍රික්කයේ පුද්ගලික ඉඩම් යුධ සමය නිසා වනාන්තර බවට පත්ව ඇති බැවින්, ඒවා නිරවුල් කර ගන්නා තෙක් රක්ෂිත වනාන්තර ගැසට් කිරීම ප්‍රමාද කිරීමට තීරණය විය. | පවත්නා තත්ත්වයන් කළමනාකරණය කර ගනිමින් එම ඉඩම්වල අයිතිය තහවුරු කර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ක්‍රියාමාර්ග ගැනීමේ දී විවිධ ගැටළුකාරී තත්වයන්ට මුහුණ දීමේ අවධානමක් පවතින බවටත් නිරීක්ෂණය විය. | | |
| (ඇ) | දෙපාර්තමේන්තුව විසින් වන වගාව සඳහා ව්‍යාපෘති 05 ක් යටතේ දිවයින පුරා පිහිටි පැළ තවාන් 40 ක පැළ නිෂ්පාදනය කරනු ලැබුවද, 2022 දෙසැම්බර් 31 දිනට එම පැළ තවාන්වල පවතින පැළ තොග සම්බන්ධ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණි. | පිළිතුරු ලබා දී නොමැත. | දෙපාර්තමේන්තු පැළ තවාන්වල පවතින සමස්ථ පැළ ප්‍රමාණය පිළිබඳව නිවැරදි දත්ත පවත්වා ගනිමින් පැළ නිසි කලට සිටුවීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | නියමිත කාල වකවානු තුළ පැළ සිටුවීමට හෝ පැළ බෙදාදීම සඳහා සැලසුම්ගත වැඩපිළිවෙළක් නොමැති වීම හේතුවෙන් මූලතිවු හි පිහිටි පැළ තවාන් 02 හි 2019 වර්ෂයේ සිට රෝපණය කරන ලද පැළ 197,736 කින් බොහොමයක් සහ ගල්ගමුව අඩවි වන කාර්යාලයට අනුබද්ධිත මැදගම පැළ තවානේ 2022 වර්ෂයේ හා ඊට පෙර නිපද වූ පැළ 67,375 කින් පැළ 6,748 ක් ද, 2019 සිට 2022 වර්ෂය දක්වා කාලය තුළ පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතියේ (ESCAMP) රු.70,716,004 ක ප්‍රතිපාදන මත රෝපණය කර නඩත්තු කරන ලද පැළ විශාල ප්‍රමාණයක් ද මියගොස් තිබුණු අතර තවත් විශාල පැළ ප්‍රමාණයක් අසාමාන්‍ය ලෙස වර්ධනය වී තිබුණි. | කොවිඩ් 19 වසංගත තත්ත්වය හා ඉන්ධන ගැටළුව හේතුවෙන් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නොහැකි තත්වයක් ඇති විය. එහෙත් මෙම පැළ ශක්තිමත්ව හා නීරෝගීව පවතින දරන ලද වියදමට ප්‍රතිලාභයක් අත්කර ගත හැකි වේ. | නියමිත කාල වකවානු තුළ පැළ සිටුවීමට හෝ බෙදාහැරීමට ප්‍රමාණවත් සැලසුම් සකස් කර සිදුවන හානිය අවම කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | විශේෂ වන වගා ව්‍යාපෘතිය යටතේ 2021 වර්ෂයේ රු.77,964 ක වියදමකින් පොළිතින් ඇසුරුම්වල රෝපනය කරන ලද පැළ 1000 ක් අපේක්ෂිත කාර්යයන් සඳහා භාවිතයට නොගැනීමෙන් ප්‍රමාණය ඉක්මවා වර්ධනය වී තිබුණු අතර නාගරික තුරු ගොමුවල මාර්ග දෙපස, ඇවිදින මංතීරු දෙපස රෝපණය කිරීමට හා කොළඹ නගරයෙහි රුක් රෝපණ වැඩසටහන්වලට ලබාදීම සඳහා 2021 සහ 2022 වර්ෂවලදී මැදගම පැළ තවානේ රු.මිලියන 02 ක | 2022 වර්ෂයේදී විවිධ වැඩසටහන් ඉලක්ක කර ගනිමින් මෙම පැළ නිෂ්පාදනය කළ ද, රටතුළ පැවති තත්ත්වය මත එම අවස්ථාව අහිමිව යන ලදී. දැනට අධි වර්ධන තත්වයක පොලිතීන් මලුද පිපිරීමකට භාජනය වෙමින් පවතින අතර 2023 වර්ෂය තුළ විවිධ වැඩසටහන් සඳහා යොදා ගැනීමට සැලසුම් සකස් කරමින් පවතී. | රජයේ මුදල් වැය කර රෝපණය කරන ලද මෙම පැළ විනාශ වීමට ඉඩ නොහැර ඵලදායි කාර්යයක් සඳහා යොදා ගැනීමට දෙපාර්තමේන්තුව විසින් විධිමත් සැලැස්මක් සකස් කිරීමට අවධානය යොමු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වියදමකින් නිෂ්පාදිත රුටබෝල් පැළ 524 ක් නිකුත් කර නොතිබීමෙන් පැළ 103 ක් මිය ගොස් තිබුණි. | | |
| (උ) | කුරුණෑගල දිසා වන කාර්යාලය මඟින් රාජ්‍ය දැව සංස්ථාවට පූර්ණ හෙළීම් සඳහා භාර දී තිබුණු වැඩ බිම් 81 ක නියමිත කාලය තුළ වැඩ නිම කරවාගෙන ආපසු භාරගැනීමට කටයුතු කර නොතිබුණු අතර 2023 පෙබරවාරි වනවිටත් භාර නොදුන් වැඩ බිම් සංඛ්‍යාව 27 ක් වීම හේතුවෙන් සැළසුම් කළ පරිදි නැවත වන වගා කිරීමට නොහැකි වී තිබුණි. එසේම ගල්ගමුව අඩවියේ අඹන්පොල බීට්ටුවේ වැඩ බිම් 03 ක ගස් 18,700 ක් පූර්ව වානිජ තුනී කිරීම් සඳහා 2021 අගෝස්තු 09 දින රාජ්‍ය දැව සංස්ථාවට භාර දී තිබුණ ද 2023 පෙබරවාරි 15 දින වන විටත් එම කාර්යය ඉටු නොකිරීමෙන් ඉතිරි ගස්වල වර්ධනය අඩාල වී තිබුණි. මෙම ප්‍රමාදයන් සඳහා රාජ්‍ය දැව සංස්ථාවෙන් ප්‍රමාද ගාස්තු අයකිරීමටත් ප්‍රමාදයන් වළක්වා ගැනීමට සුදුසු වැඩ පිළිවෙලක් යෙදීමටත් දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි. | කුරුණෑගල දිසාවේ පූර්ණ හෙළීම් වැඩබිම් නියමිත කාලයට භාර නොදීම මත රාජ්‍ය දැව සංස්ථාව මඟින් තැන්පත් කර ඇති ඇප මුදල් රජය සතු කිරීමට තීරණය කර ඇත.<br>රාජ්‍ය දැව සංස්ථාව මඟින් 2020, 2021 හා 2022 වර්ෂවල වාණිජ තුනී කිරීම් සඳහා භාරදෙන ලද වන වගාවල හෙළීම් කටයුතු මේ වන විටද ආරම්භ කර නොමැති අතර වරින්වර දැනුවත් කළද එය මෙතෙක් සාර්ථකවී නොමැත. | දෙපාර්තමේන්තුවේ කාර්යභාරය බාධාවකින් තොරව ඉටුකර ගැනීම සඳහා රාජ්‍ය දැව සංස්ථාව වෙත පවරන ලද කාර්යභාරයන් ප්‍රමාදයකින් තොරව ඉටු කරවා ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ඌ) | ගසක අපේක්ෂිත වර්ධන කාලය ඉක්ම වූ දිස්ත්‍රික්ක 08 ක වගා බිම් 234 ක් දැව හෙළීම සඳහා රාජ්‍ය දැව සංස්ථාවට නිදහස් කර නොතිබීමෙන් එම වගා බිම් බහුලව වන අපරාධවලට සහ වෙනත් ස්වභාවික උවදුරුවලට ගොදුරු වී විනාශයට පත්වීමේ අවදානමක් පවතින බවටත්, නියමිත කාල වකවානු තුළ ගස් හෙළීම් නොකිරීමෙන් රජයට රාජ්‍ය භාගය අහිමි වීමක් සිදුවන බවටත් නිරීක්ෂණය විය. | නැවත වන වගා කිරීම භාණ්ඩාගාරයෙන් අදාළ වර්ෂය වෙනුවෙන් වෙන්කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය, වාර්ෂික දැව අවශ්‍යතාවය, තිරසාර ලෙස දැව අස්වැන්න කළමනාකරණය කිරීම,<br>රාජ්‍ය දැව සංස්ථාවට වාර්ෂිකව දැව හෙළීම් කිරීමට ඇති හැකියාව යන කරුණු මත පූර්ණ හෙළීම් කිරීම සඳහා රාජ්‍ය දැව සංස්ථාව වෙත ලබා දෙනු ලබන වන වගා ප්‍රමාණය තීරණය කෙරේ. | ඒ ඒ වන වගාවේ ආයු කාලය සහ වන අපරාධවලට හා වෙනත් ස්වභාවික උවදුරුවලට ගොදුරු වීම යන කරුණු සැළකිල්ලට ගෙන එවැනි වගා බිම්වලට ප්‍රමුඛතාවය ලබා දී පූර්ණ හෙළීම් කටයුතු සිදුකිරීම සඳහා කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (එ) | වන වගා කළමනාකරණය සහ පසුවිපරම් ක්‍රියාවලියක් ක්‍රියාත්මක නොකිරීමෙන් කෑගල්ල, ත්‍රිකුණාමලය සහ අනුරාධපුර දිස්ත්‍රික්කයන්හි වගා බිම් 94 ක් අසාර්ථක වී තිබුණු අතර ඒවා පුනරුත්ථාපනය කර නිසි පරිදි නඩත්තු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග නොගෙන ආයු කාලය සම්පූර්ණ වීමට ඉඩ හැර තිබුණු බවට නිරීක්ෂණය විය. | භාණ්ඩාගාරයෙන් විශේෂ වන වගා ව්‍යාපෘතිය යටතේ ලබා දෙන ලද ප්‍රතිපාදන අනුව 2021 වර්ෂයේදී හඳුනාගත් පරිහානියට පත් වන වගා හෙක්ටයාර් 892 ක් නැවත ප්‍රතිස්ථාපනය කිරීමට කටයුතු කරන ලදී. | වන වගා කළමනාකරණය සහ පසුවිපරම් ක්‍රියාවලිය දෙපාර්තමේන්තුවේ පවතින අභ්‍යන්තර පාලන පද්ධතියට අනුකූලව සිදුකළ යුතුය. |

## 3.2 සැලැසුම් කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුවේ සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු සහ ඉලක්කයන් ඇතුළත් කර නොතිබුණු අතර 2006 මාර්තු 24 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 128 මඟින් හඳුන්වා දී ඇති ආකෘති පත්‍රය ප්‍රකාරව රේඛීය අයිතමයන් යටතේ එක් එක් අංශය විසින් ප්‍රසම්පාදනය කිරීමට අපේක්ෂිත වැඩ, භාණ්ඩ හා සේවා විස්තර හා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත කාල රාමුව ඇතුළත් කර විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් ද සකස් කර නොතිබුණි. | විගණන නිරීක්ෂණයන් සමඟ එකඟ වෙමි. | 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන අයවැය චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ අවශ්‍ය විස්තර සහිතව ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර ඒවා ක්‍රියාවේ යෙදවිය යුතුය. |
| (ආ) | බීජ සිටුවීම හා නඩත්තුව ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර තිබුණ ද පැළ බෙදා හැරීම සම්බන්ධව ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබීමෙන් සැළසුම්ගත වැඩ පිළිවෙළක් ඔස්සේ පැළ බෙදාහැරීම සිදුවන බවට සනාථ කරගත නොහැකිවිය. | විගණනය විසින් පෙන්වා දී ඇති පරිදි ඉදිරියේදී අරමුණු හා ඊට අදාළ උපයෝජනයන් ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කිරීමට සටහන් තබා ගන්නා ලදී. | අපේක්ෂිත අරමුණු ලඟාකර ගැනීම සඳහා වූ ක්‍රියාකාරකම් ඇතුළත් කර ක්‍රියාකාරී සැලැස්ම සකස් කළ යුතුය. |

## 3.3 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දැව හෙළීම් සිදුකරමින් පවතින කුරුණෑගල දිසාවේ අඩවි වන කාර්යාල 05 කට අයත් හෙක්ටයාර 108.7 ක් පමණ වන භූමි ප්‍රමාණයක නැවත වන වගා සඳහා සිටුවීමට අවශ්‍ය පැළ නිෂ්පාදනය කිරීමට කටයුතු කර නොතිබුණි. | දෙපාර්තමේන්තු ප්‍රතිපාදන ලැබීම මත 2023 මාර්තු මාසයේදී පැල නිෂ්පාදනය ආරම්භ කරන ලදී. | අවශ්‍යතාවයන් නිවැරදිව හඳුනාගෙන නැවත වන වගාව සඳහා වන පැළ නිෂ්පාදනය නියමිත ආකාරයට සිදු කළ යුතුය. |

## 3.4 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍ර ලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කළ යුතුව තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.1 ඡේදය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව භාෂාත්‍රයෙන් සකස් කර මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ගත වීමට පෙර සභාගත කිරීමට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු වුවද, 2021 වර්ෂය සඳහා වූ වාර්ෂික කාර්යසාධන වාර්තාව වසරක ප්‍රමාදයකින් පසු 2023 ජූනි 06 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව භාෂාත්‍රයෙන් සකස් කර මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ගත වීමට පෙර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුය. |

## 3.5 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.9.4 මාර්ගෝපදේශය ප්‍රකාරව රු.2,000,000 ක් ඉක්මවන කොන්ත්‍රාත් ලියාපදිංචි සමිතියකින් ඉටුකර ගත නොහැකි වුවද, කන්නෙලිය සංරක්ෂණ මධ්‍යස්ථානයේ පැරණි දේශනාගාරය අළුත්වැඩියා කිරීම | වෙනත් සමිතියක් තෝරා ගෙන ගිවිසුම් ගත වී කටයුතු සිදු කිරීමට කාලය මදි වීම ආදී හේතු සළකා බලා එම ගොවි සංවිධානය මඟින් සිදු කරන ලදි. | අරපිරිමැසුම්දායි ආකාරයට ඇස්තමේන්තු සකස් කර රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූලව ප්‍රසම්පාදනයන් සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සඳහා රු.2,547,166 ක මුළු පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කිරීමේ හැකියාව තිබිය දී රු.1,816,008 ක් සහ රු.731,158 ක් බැගින් ඇස්තමේන්තු දෙකක් සකස් කර ප්‍රජාපාදක ගොවි සංවිධානයක් මඟින් ඉටුකරවාගෙන තිබුණි. | | |
| (ආ) | 2019 දෙසැම්බර් 17 දිනැති අංක 08/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 2.1 ඡේදය ප්‍රකාරව දෙපාර්තමේන්තුව e-GP පද්ධතිය යටතේ විද්‍යුත් ප්‍රසම්පාදනය සඳහා ලියාපදිංචි වී නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව e-GP පද්ධතිය යටතේ ලියාපදිංචි වී විද්‍යුත් ප්‍රසම්පාදනයන් සිදුකළ යුතුය. |

## 3.6 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 වර්ෂයේ සිට වසා දමා තිබුණු ගාල්ල දිසා වන කාර්යාලය යටතේ පාලනය වන වැකුණුගොඩ සංචාරක බංගලාව 2020 දෙසැම්බර් මස රු.687,337ක වියදමක් දරා අලුත්වැඩියා කර තිබුණ ද, 2023 ජුනි 30 දින වන විටත් ඌණ උපයෝජිතව පැවතුණි. | දැනට සංචාරක බංගලා භාරකරුවෙකු හෝ මුරකරුවකු පත්කර නොමැති වීම සහ එම බංගලාව වෙන් කිරීමක් සිදු නොකිරීම නිසා නිරන්තරව භාවිතයට ගැනීමක් සිදු නොවන නමුත්, එම පරිශ්‍රය නඩත්තු කර රාජකාරී කටයුතුවලට පැමිණෙන නිලධාරීන්ට අවශ්‍ය විට භාවිතා කෙරේ. | කාර්යක්ෂමව භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලය තුළ රුපියල් මිලියන 7 කට අධික ආදායම් උපයාගෙන තිබුණු කන්නෙලිය සංචාරක බංගලාව 2020 ජනවාරි සිට නඩත්තු කටයුතු වෙනුවෙන් තාවකාලිකව වසා දමා තිබුණ ද, අදාළ නඩත්තු කටයුතු සිදු නොකිරීම නිසා මලාපවහන පද්ධතිය විනාශ වී ගොඩනැගිල්ලේ බිත්ති ද ඉරිතලා ගොස් දැඩිලෙස හානියට පත්වීමේ අවධානමක් පැවතුණි. මේ නිසා සංචාරකයන්ට නවාතැන් පහසුකම් සැපයීම අඩපණ වී රජයට ආදායම් ද අහිමි වී තිබුණි. | මුලුතැන්ගෙය සහ වැසිකිලි පද්ධතිය ආශ්‍රිතව පොළොව ගිලා බැසීමට ලක්වීම නිසා හදිසි ආපදා තත්වයක් උද්ගත වීම හේතුවෙන් 2020 ජනවාරි මස සිට නේවාසික සංචාරකයින් සඳහා තාවකාලිකව වසා දමා තිබුණි. | අවශ්‍ය වන අලුත් වැඩියාවන් සිදු කර කාර්යක්ෂමව භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | පූර්ණ අලුත්වැඩියාවක් කළ යුතු කුරුණෑගල කුඹල්ගම සංචාරක බංගලාව සඳහා 2020 වර්ෂයේ දී රු.500,000 ක ප්‍රතිපාදන ලබා දී තිබුණ ද, අදාළ අලුත්වැඩියා කටයුතු සිදු නොකිරීම හේතුවෙන් සංචාරක බංගලාවක පැවතිය යුතු ගුණාත්මකභාවය පවත්වා ගැනීමට නොහැකි වී තිබුණි. | කුරුණෑගල දිසාවේ ගොඩනැගිලි නඩත්තු කිරීම සම්බන්ධව වරින් වර ප්‍රධාන කාර්යාලය දැනුවත් කර ඇති අතර, තීන්ත ආලේප කිරීම සඳහා සඳහා 2023.03.27 දින රු.350,000 ක ප්‍රතිපාදන ලබාදී ඇත. | වත්කම් නිසිලෙස කළමනාකරණය කර කාර්යක්ෂමව භාවිතයට ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | දෙපාර්තමේන්තුවට අයත් වාහන සංචිතය භෞතික සත්‍යාපනයක් සිදුකර නැති අතර වාහන 711 ක් පවතින බවට තොරතුරු ඉදිරිපත් විය. එසේ වුව ද, එයින් වාහන 288 ක තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබීමෙන් එවායේ භෞතික පැවැත්ම සනාථ කළ නොහැකි විය. | පිළිතුරු ලබා දී නොමැත. | සියළුම වාහන භෞතිකව සත්‍යාපනය කර ඒවායේ පැවැත්ම පිළිබඳ විගණනය වෙත සනාථ කළ යුතුය. |
| (ඉ) | දෙපාර්තමේන්තුව විසින් වෙනත් රාජ්‍ය ආයතන සතු වාහන භාවිතා කළ ද, එම වාහන සංඛ්‍යාව හා එහි අයිතිය පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවූ අතර ඒවායේ අයිතිය පවරා ගැනීමට හෝ ආපසු භාර දීමට ද කටයුතු කර නොතිබුණි. ඉඩම්, වාරිමාර්ග හා මහවැලි සංවර්ධන අමාත්‍යාංශය සතු අංක 64-4438 දරන ලෑන්ඩ් රෝවර් වර්ගයේ ජීප් රථයක් ගාල්ල දිසාවන කාර්යාලයේ 2017 වර්ෂයේ සිට ද, උතුරු නැගෙනහිර පළාත් සභාවට අයිති අංක 52 – 5093 දරන නිසාන් වර්ගයේ කැබ් රථයක් මන්නාරම් දිසාවන කාර්යාලයේ 2015 වර්ෂයේ සිට ද ධාවනයෙන් ඉවත් කර දිරායමින් පැවතුණි. | පිළිතුරු ලබා දී නොමැත. | වෙනත් රාජ්‍ය ආයතන සතු දෙපාර්තමේන්තුව විසින් භාවිතා කරන වාහන හඳුනාගෙන අයිතිය තහවුරු කර ගැනීමට හෝ ආපසු පවරා දීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | භාවිතයට ගත නොහැකි ලියාපදිංචි වර්ෂය ද නිරීක්ෂණය නොවූ යතුරු පැදි 13 ක් සහ පාපැදි 05 ක් වර්ෂ 04 කට අධික කාලයක් 2020 ඔක්තෝබර් 02 දිනැති අංක 05/2020 දරන මුදල් අමාත්‍යාංශ වත්කම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව අපහරණය කිරීමට කටයුතු නොකර ගාල්ල දිසාවන කාර්යාලයේ ගාල්කර තිබුණි. | ගර්හිත වාහන අපහරණය හා තක්සේරු කිරීම සඳහා පත් කර ඇති කමිටුව 2022.06.16 දින රැස් වී යතුරු පැදි 13 ක් පරීක්ෂාවට ලක් කර ඇත. එම කමිටු වාර්තාව අනුව ඉදිරි කටයුතු කිරීමට නියමිත බව දන්වා සිටිමි. | වත්කම් කලමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව අපහරණය කළයුතු වාහන සම්බන්ධයෙන් කටයුතු කළ යුතුය. |
| (උ) | ගල්ගමුව අඩවි වන කාර්යාලයේ වාහන 04 ක් අලුත්වැඩියා නොකිරීම හේතුවෙන් ධාවනයෙන් ඉවත් කර තිබුණු අතර ධාවන තත්ත්වයේ පවතින එහෙත් අළුත්වැඩියා කළයුතු වාහන 02 ක් නිසිකළට අළුත්වැඩියාවන් සිදු නොකර ගර්හිත තත්ත්වයට පත්වීමේ අවධානමක් පැවතුණි. වසර ගණනාවක සිට ගර්හිතව | එක් යතුරු පැදියක් අළුත්වැඩියා කිරීමටත්,<br>යතුරු පැදි 03 ක් අපහරණය කිරීමටත් තීරණය කර ඇත.<br>බඳ දිරාපත්වී ඇති කැබ්රථය ඉදිරියේ දී අලුත්වැඩියා කිරීමටත්,<br>මේ වන විට ධාවන තත්වයේ පවතින ගල්ගමුව අඩවියේ ඇති යතුරු පැදිය | වාහන මනාව නඩත්තු කර කාර්යක්ෂමව භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පවතින කුරුණෑගල දිසා වන කාර්යාලය, කුරුණෑගල අඩවි වන කාර්යාලය සහ මැල්සිරිපුර අඩවි වන කාර්යාලය සඳහා වෙන්කර තිබුණු වාහන 06 ක් ද අපහරණය කිරීම සඳහා අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | සඳහා ආදායම් බලපත්‍රය ලබා ගැනීමටත් කටයුතු කෙරේ. | |
| (ඉ) | අපහරණය කිරීම සඳහා හඳුනාගෙන තිබුණු වාහන 169 කින් තක්සේරු වාර්තා ලබාගෙන තිබූ වාහන 101 ක් සඳහා විවෘත මිලගණන් කැඳවීමටත්, වාහන 68 ක තක්සේරු වාර්තා ලබා ගැනීමටත් කටයුතු නොකිරීම හේතුවෙන් අපහරණය කිරීමට නොහැකි වී තිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | ප්‍රමාද වී ඇති වාර්තා අදාළ කමිටුවෙන් ලබාගෙන අපහරණ කටයුතු කඩිනම් කළ යුතුය. |

## 3.7 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ හානි හා පාඩු ලේඛනයේ කොළ ඉරී හානියට පත්ව, අකුරු ද බොඳවී පිටු කිහිපයක් එකිනෙක අලවා තිබීමත්, 2011 වර්ෂයට පෙර සිදුවූ හානි හා පාඩු ඊට ඇතුළත් කර නොතිබීමත් හේතුවෙන් හානි හා පාඩු නිවැරදිව ලේඛන ගත කර බේරුම් කර ඇද්ද යන්න විගණනයේ දී තහවුරු කරගත නොහැකි විය. | පිළිතුරු ලබා දී නොමැත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව හානි හා පාඩු ලේඛනය නියමිත තත්ත්වයෙන් යුතුව යාවත්කාලීන කර පවත්වා ගත යුතු අතර හානි හා පාඩු සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3.8 අනාර්ථික ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අලව්ව- විහාරකන්ද 01/001 හි ඉඩම් හෙක්ටයාර් 35 ක 2020 වර්ෂයේ සිදුකළ "කායා" වන වගාව රැක ගැනීමට අපොහොසත් වීමෙන් 2023 පෙබරවාරි 14 දින වන විට සියයට 70 ක් පමණ සතුන් හානි කිරීම හේතුවෙන් විනාශ වී තිබුණු නමුත් 2022 වර්ෂය තුළ රු.3,886,452 ක් වැයකොට නඩත්තු 04 ක් ද, සිදු කර තිබුණි. | පැල ආරක්ෂා කර ගැනීම සඳහා පැලයේ මුල සිට අඩි 02 ක් පමණ උසට කළුතෙල් ආලේප කරනු ලැබුවද, නැවත නැවත ඉත්තෑවන් කා දැමීම සිදු වන බැවින් දැනට ප්‍රතිකර්මයක් නොමැතිව ජීවී පැල ප්‍රතිශතය 30% - 40% මට්ටමේ පවතී. | වන වගා කළමනාකරණය හා ආරක්ෂාව සම්බන්ධයෙන් විධිමත් වැඩ පිළිවෙලක් සකස් කර ස්ථාපිත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | නඩත්තු කටයුතු අතහැර දමා ඇත. | |
| (ආ) | කුරුණෑගල ඇත්ගාල වන වගාව ඇතුළුව වන වගා 04 ක් සඳහා 2022 සහ 2021 වර්ෂයන් හි දී නිෂ්පාදනය කරන ලද තේක්ක පැළ සහ කායා පැළ 51,449 ක් අධි වර්ධනය මත පොලිතීන් පුපුරා යෑමෙන් සහ කෘමි හානි වළක්වා ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් විනාශ වී තිබුණු බැවින් ඒ වෙනුවෙන් දරන ලද රු.1,208,372 ක් නිෂ්කාර්ය වියදමක් වී තිබුණි. | මෙම පැල විනාශ වීම රාජ්‍ය දැව සංස්ථාව නිශ්චිත කාල සීමාව තුළ වන වගා හෙලීම් සිදු කර වැඩබිම ආපසු භාර නොදීම මත සිදු වුවක් වන හෙයින් රාජ්‍ය දැව සංස්ථාව තැන්පත් කර තිබූ ඇප මුදලින් රු.585,807 ක් රජය සතු කිරීමට අපේක්ෂිතය. | දෙපාර්තමේන්තු සැලසුම් අනුව පැළ සිටුවීමට රාජ්‍ය දැව සංස්ථාව වෙතින් කලට වේලාවට වැඩබිම්වල වැඩ නිම කරවා ගැනීමටත්, නිෂ්පාදනය කරන ලද පැළ නඩත්තු කිරීම සඳහා දැරීමට සිදුවන අමතර වියදම් සහ පැළ විනාශ වීමෙන් රජයට සිදුවන පාඩුව රාජ්‍ය දැව සංස්ථාව වෙතින් අය කර ගැනීමටත් කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2021 සැප්තැම්බර් මස අග වන විට ක්ෂේත්‍රයේ සිටුවීම සඳහා සකස් කරන ලෙස 2021 අප්‍රේල් මස කුරුණෑගල දිසාවන කාර්යාලයට ලබාදී තිබුණු උපදෙස් අනුව එම වසරේදී රු.500,000 ක වියදමකින් පොලිතීන් මලුවල නිෂ්පාදනය කරන ලද පැළ 5000 ක් හා ගල්ගමුව අඩවියේ මැදගම පැළ තවානේ 2021 වසරේදී රු.400,000 ක් වැය කර නිෂ්පාදනය කරන ලද 12″X18″ ප්‍රමාණයේ පැළ 4,000 ක් භාවිතයට නොගෙන තවාන්වල රඳවාගෙන තිබුණි. | දැනට එම පැළ ප්‍රාදේශීය ඉල්ලීම් මත වන ව්‍යාපෘති වැඩසටහන් සඳහා අවස්ථානුකූලව යොදාගනු ලබයි. | නිෂ්පාදිත පැළ සැලසුම්ගත ආකාරයට භාවිතයට ගැනිමට කටයුතු කළ යුතුය. |

### 3.9 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

පහත සඳහන් නිරීක්ෂණය කෙරේ.

| <u>විගණන විමසුම පිළිබඳ විස්තරය</u> | <u>ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම</u> | <u>නිර්දේශය</u> |
|---|---|---|
| විගණකාධිපතිවරයා විසින් 2019 හා 2020 වර්ෂයන්හි දී නිකුත් කරන ලද විගණන විමසුම් 02 ක් සඳහා පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | ලබා දී ඇති කාලය තුළ විගණන විමසුම් සඳහා පිළිතුරු ලබාදීමට කටයුතු කළ යුතුය. |

## 3.10 කළමනාකරණ දූර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දැව ව්‍යාපාර වාර්ෂිකව ලියාපදිංචි කිරීම සම්බන්ධ කාර්යයන් ගාල්ල දිසා වන කාර්යාලය විසින් නිසි පරිදි ඉටු කර නොතිබුණු අතර ව්‍යාපාර කටයුතු නොකරන ආයතනවල ලියාපදිංචිය අවලංගු කිරීමටත්, බලපත්‍ර නොමැතිව දැව ව්‍යාපාර පවත්වාගෙන යන ආයතන සම්බන්ධයෙන් නිතිමය ක්‍රියාමාර්ග ගැනීමටත් කටයුතු කර නොතිබුණි. | ක්ෂේත්‍රය පරීක්ෂා කර ලියාපදිංචි නොකරන ලද දැව ව්‍යාපාර සම්බන්ධයෙන් අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු සිදු කරන ලෙස සියළුම අඩවි වන නිලධාරීන්ට උපදෙස් ලබා දෙන ලදි. | දැව ව්‍යාපාර පවත්වාගෙන යාම පිළිබඳ නිරතුරුව පසුවිපරම් කර ඒවායේ ලියාපදිංචිය වාර්ෂිකව අලුත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | කුරුණෑගල දිසා වන කාර්යාලයේ පාලනය යටතේ පවත්වාගෙන යන දැව ව්‍යාපාර 370 ක් 2023 වර්ෂය සඳහා බලපත්‍ර අලුත් කර නොතිබුණු අතර එමඟින් 2023 වර්ෂයේ පෙබරවාරි මස අවසාන වන විට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අහිමිවී ඇති මුළු ආදායම රු.3,058,907 ක් බවට නිරීක්ෂණය විය. | 2014.12.03 දිනැතිව නිකුත් කරන ලද අංක 1891/26 දරන ගැසට් පත්‍රය මඟින් දැව ව්‍යාපාර කාලය දීර්ඝ කිරීම සඳහා මාස 06 ක සහන කාලයක් ව්‍යාපාර අයිතිකරුවන් වෙත ලබා දී ඇති බැවින් එම කාලසීමාව අවසානයේ, නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ලැබේ. | දැව ව්‍යාපාර පවත්වාගෙන යාම පිළිබඳ නිරතුරුව පසුවිපරම් කර නියමිත දිනට වාර්ෂික ලියාපදිංචිය අලුත් කර අදාළ ගාස්තු අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2017 සිට 2022 කාල වකවානුව තුළ මුලතිව් දිසා වන කාර්යාලය සහ ඕළුමඩු අඩවි වන කාර්යාලය යටතේ පාලනය වන රක්ෂිත වනාන්තර අනවසරයෙන් එළි කිරීම්, ගස් හෙලීම්, දැව ප්‍රවාහනය වැනි වන අපරාධ 1,420 ක් සිදු කර ඇති බවටත්, කුරුණෑගල දිසා වන කාර්යාලයට අයත් අඩවි 05 යටතේ පාලනය වන රක්ෂිත වනාන්තර හෙක්ටයාර් 253.053 කට හානි සිදු කර තිබුණු බවත්, ඊට අදාළ නඩු කටයුතු ඉතා මන්දගාමීව සිදුවන බවත්, වන අපරාධ දැව විශාල ලෙස ගොඩගැසී දිරාපත් වෙමින් පවතින බවත් නිරීක්ෂණය විය. | විගණන ඉදිරිපත් කිරීම් සමඟ එකඟ වෙමි. ප්‍රමාදයකින් තොරව නඩු පැවරීමට කටයුතු කරනු ලැබුව ද නඩු විසඳීමේ ප්‍රමාදය අපගේ පාලනයෙන් බැහැරව සිදුවන්නක් බැවින් ඒ පිළිබඳව යමක් ප්‍රකාශ කළ නොහැක. හැකි සෑම අවස්ථාවකදීම අධිකරණ ක්‍රියාවලිය අවසන් නොවූවද නියෝග ලබාගෙන දැව විකිණීමට රාජ්‍ය දැව සංස්ථාව වෙත දැනුම් දීමට කටයුතු කර ඇත. | වන අපරාධ පාලනයට සහ අවම කර ගැනීමට කටයුතු කළ යුතු අතර අදාළ අධිකරණ සමඟ සෘජුවම සම්බන්ධ වී අදාළ නඩු විසඳීම කාර්යක්ෂම කර ගැනීමට පියවර ගත යුතුය. |
| (ඈ) | වන සංරක්ෂණ ආඥා පනතේ 64 වගන්තියේ 2(ඇ)(i) ඡේදය ප්‍රකාරව වන අපරාධවලට යොදාගත් රාජසන්තක කරන ලද වාහන හා වෙනත් උපකරණ වෙන්දේසි කර ලැබෙන ආදායමෙන් හරි අඩකට නොඅඩු මුදලක් දෙපාර්තමේන්තු අරමුදලට බැර කළයුතු වුවත් රාජසන්තක | අධිකරණය මඟින් වෙන්දේසි කිරීම ඉතා මන්දගාමීව සිදුවන අතර වෙන්දේසියේ විකිණීමෙන් පසුව බැර කිරීම්වලදී එය දඩ මුදලක් ද, නැතහොත් වෙන්දේසි කරන ලද මුදලක් ද යන්න සටහන් නොකරන බැවින් හඳුනා ගැනීම දුෂ්කරය. | වන අපරාධ සම්බන්ධයෙන් කළමනාකරණය විසින් අදාළ අධිකරණ සමඟ සෘජුවම සම්බන්ධ වී එම භාණ්ඩ කාලීනව වෙන්දේසි කිරීමට |

| | | | |
|---|---|---|---|
| | කරන ලද එහෙත් කාලීනව වෙන්දේසි කිරීමට කටයුතු නොකළ ලොරි රථයක් සහ අත්ට්‍රැක්ටර 08 ක් මැල්සිරිපුර අඩවි වන කාර්යාල පරිශ්‍රය, වැවරවුම පැළ තවාන් පරිශ්‍රය සහ කුරුණෑගල අඩවි වන කාර්යාල පරිශ්‍රය තුළ අනාරක්ෂිත ලෙස ගාල් කර තිබුණි. | | කටයුතු කළ යුතුය. |
| (ඉ) | කුරුණෑගල දිසාවන කාර්යාලයට අයත් අඩවි 05 ට අදාළ වන අපරාධ සම්බන්ධයෙන් 2019 වර්ෂයේ සිට 2023 පෙබරවාරි මාසය දක්වා උසාවිවලින් ලැබුණු රු.10,009,477 ක දඩ මුදල්වලින් පනතේ 64 වගන්තියේ 2(ඇ)(**i**) ඡේදය ප්‍රකාරව නිලධාරින්ට පිරිනැමිය යුතු තැගි මුදල් ගෙවීමට දෙපාර්තමේන්තුව විසින් පියවර ගෙන නොතිබුණි. එය නිලධාරින්ගේ කාර්යක්ෂමතාව අඩුවීම කෙරෙහි බලපානු ලබන බවට නිරීක්ෂණය විය. | කටයුතු අවසන් කර දිසා වන කාර්යාලයට ලැබී තිබූ වන අපරාධ වාර්තා බහුතර ප්‍රමාණයකට මේ වන විට තැගි මුදල් ගෙවීමට කටයුතු කර ඇති අතර රු.1,841,988 ක මුදලක් 2019 වර්ෂයේ සිට 2023 දක්වා ගෙවීම් කර ඇත. | පනතේ විධිවිධාන ප්‍රකාරව අදාළ තැගි මුදල් ප්‍රමාදයකින් තොරව ගෙවා නිලධාරීන් දිරිමත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | කුඩා පරිමාණ විදුලි බලාගාරයක් පවත්වාගෙන යාම සඳහා බලශක්ති පුද්ගලික සමාගමකට 2015 පෙබරවාරි මස සිට පර්චස් 200 ක් බදු දී තිබුණ ද**,** ගිවිසුම් ප්‍රකාරව පර්චසයක් සඳහා වසරකට රු.5,000 ක් බැගින් පළමු වසර සඳහා පමණක් රු.1,000,000 ක බදු මුදල් ලබාගෙන ඉන් අනතුරුව කිසිදු මුදලක් අයකර ගෙන නොතිබුණි. මෙම සමාගම විසින් ගිවිසුම්ගත පර්චස් 200 ට අමතරව තවත් පර්චස් 523.78 ක් අනවසරයෙන් පරිහරණය කර තිබුණු අතර ඒ අනුව 2023 පෙබරවාරි 18 දින වන විට පර්චස් 723.78 ක් සඳහා වසර 08 ක් වෙනුවෙන් එම සමාගමෙන් අයවිය යුතු මුදල රු.40,349,839 ක් විය. | පිළිතුරු ලැබී නොමැත. | වන සංරක්ෂණ ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව භාහිර පාර්ශවයන් විසින් වනයෙන් ලබාගන්නා මූල්‍යමය හෝ අනාාාකාර ප්‍රතිලාභවල වටිනාකමට සමානුපාතික වන අයුරින් ගාස්තු අයකළ යුතු බැවින් ඒ අනුව කටයුතු කළ යුතුය. |
| (උ) | පුද්ගලික සමාගමක් විසින් පවත්වාගෙන ගිය කළුගල් කොරියක 2013 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලය තුළ සීමාව ඉක්මවා කැණීම් කරන ලද ගල් කියුබ් 541,471 ක් වෙනුවෙන් දෙපාර්තමේන්තුවට අයවිය යුතු රු.133,093,715 ක් ඉදිරි වර්ෂ **3** ක් තුළ මාසික වාරික වශයෙන් අය කර ගැනීමට 2020 ඔක්තෝබර් මස ලබා දී තිබූ අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව 2022 දෙසැම්බර් 31 දින වන විට අය කරගත යුතුව තිබූ රු.77,638,000 කින් | හිඟ පුරස්කාර මුදල රු.58,764,080 ක් අයකර ගැනීම සඳහා අභියාචනාධිකරණයේ නඩුව විභාග වෙමින් පවතී. | අවශ්‍ය නිසි ක්‍රියාමාර්ග ගෙන අයවිය යුතු මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

රු.66,158,183 ක් අය කරගෙන නොතිබුණු අතර රු.5,000,000 ක අගරු චෙක්පතක් ද ඒ අතර විය.

## 4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| "වනාන්තර ආරක්ෂා කිරීම හා ප්‍රතිස්ථාපනය කිරීම" සහ "භෞමික පරිසර පද්ධති හා තිරසාරව කළමනාකරණය කරන ලද වනාන්තර ආරක්ෂා කිරීම, ප්‍රතිස්ථාපනය කිරීම හා තිරසර භාවිතය ප්‍රවර්ධනය කිරීම, කාන්තාරකරණයට එරෙහිව කටයුතු කිරීම, ජෛව විවිධත්ව හානිය වැළැක්වීම" වශයෙන් 2020 වර්ෂය සඳහා දෙපාර්තමේන්තුව විසින් හඳුනා ගෙන තිබුණු ප්‍රධාන තිරසාර සංවර්ධන අරමුණු 2 ක් යටතේ 2030 වර්ෂය වන විට වන ආවරණය සියයට 32 දක්වා වැඩි කිරීම ඉලක්ක කර තිබුණි. එසේ වුවද, 2022 වර්ෂයේ කාර්යසාධන පිළිබඳ තොරතුරු, මුළු වන ගහනය සහ ඊට සාපේක්ෂව තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ සමස්ත ප්‍රගතිය පිළිබඳ තොරතුරු ඉදිරිපත් නොවීමෙන් අරමුණු ළඟාකරගත් බවට සනාථ කරගත නොහැකි විය. | අදහස් දක්වා නැත. | තිරසර සංවර්ධන අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කළ යුතු අතර එහි ප්‍රගතිය විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

## 5. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2022 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය 3,229 ක් වුවද, තත්‍ය සංඛ්‍යාව 2,504 ක් වීමෙන් පුරප්පාඩු සංඛ්‍යාව 725 ක් විය. ඒඅතරින් ජ්‍යෙෂ්ඨ මට්මට අයත් නියෝජ්‍ය හා සහකාර වන සංරක්ෂක නිලධාරීන් 33 ක් ද, තෘතියික මට්ටමට අයත් වන පාලක (විශේෂ) හා දිසා වන නිළධාරීන් 22 ක් ද, ද්විතීක මට්ටමට අයත් අඩවි වන නිළධාරීන් 86 දෙනෙකු හා බීට්ටු වන නිළධාරීන් 127 දෙනෙක් ද ඇතුළුව තනතුරු 725 ක් පුරප්පාඩු වී පැවතීම විශේෂයෙන් ප්‍රාදේශීය කාර්යාලවල කටයුතු කාර්යක්ෂමව ඉටු කර ගැනීම සහ වන අපරාධ වැළැක්වීම කෙරෙහි බලපානු ලබන බවට නිරීක්ෂණය විය. | පිළිතුරු ලබා දී නොමැත. | විධිමත් අනුමැතියක් ලබා ගෙන සේවක පුරප්පාඩු පිරවීමට හෝ පවතින සේවක සංඛ්‍යාව මත කටයුතු කළ හැකිනම් අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනය කර ගැනීමට කටයුතු කළ යුතුය. |